ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

***

## පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියානු නාවික හමුදුවේ අයිරාවත් නෞකාව කොළඹට පැමිණේ</u>

ඉන්දීය නාවික හමුදවේ ශර්දුල් පන්තියේ ගොඩබෑමේ නැව් ටැංකියක් (Landing Ship Tank) වන අයිරාවත් නෞකාව 2023 ඔක්තෝබර් 18 වන දින කොළඹට ළඟා විය. නෞකාවේ අණ දෙන නිලධාරි කොමාන්ඩර් රින්දු බාබු මහතා බටහිර නාවික ප්‍රදේශය භාර අණ දෙන නිලධාරි රියර් අද්මිරාල් ටී. එස්. කේ. පෙරේරා මහතා හමු විය.

2. ඉන්දියානු රජයේ "අසල්වැසියා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය අනුව නාවික මාණ්ඩලික සහකාර ප්‍රධානි (විදේශ සහයෝගිතා) රියර් අද්මිරාල් නිර්භායි බප්නා මහතා 2023 ඔක්තෝබර් 18 වන දින නෞකාවේ පැවති උත්සවයකදී ඉන්දීය රජයේ ප්‍රදානයක් යටතේ වටිනා යන්ත්‍රෝපකරණ කට්ටල ශ්‍රී ලංකා නාවික හමුදවේ ඉංජිනේරු අංශයේ අධ්‍යක්ෂ ජෙනරාල් රියර් අද්මිරාල් කේ. ඩබ්. ඒ. ආර්. අයි. රණසිංහ මහතා වෙත භාර දුන්නේය. නිසි කාලයේ දී අමතර කොටස් ශ්‍රී ලංකා නාවික හමුදව සතු වීම ශ්‍රී ලංකා නාවික හමුදවේ ප්‍රශස්ථ මෙහෙයුම් කටයුතු සහතික කරනු ඇත.

3. ඉන්දියානු නාවික හමුදවේ මෙම ප්‍රයත්නයන් මිත්‍රශීලි අසල්වැසියන් සමඟ සබඳතා සවිමත් කර ගනිමින් "මිත්‍රත්වයේ පාලම්" ගොඩනැගීමේ මූලික පරමාර්ථය හා සමපාත වේ.

***

***කොළඹ***

***2023 ඔක්තෝබර් 18***